# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2194/4 - 2020 සැප්තැම්බර් මස 21 වැනි සඳුදා - 2020.09.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නාමල් රාජපක්ෂ (පා.ම.),
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2018.09.22 දිනැති අංක 2089/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 8 (2) නියෝගය ඉවත් කොට සංශෝධනය කරන ලද 2019 අගෝස්තු 23 වැනි දින නිකුත් කරන ලද අංක 2137/86 දරන නියෝගවල 8 (2) සංශෝධිත නියෝගය ඉවත් කොට සංශෝධනය කරන ලද 2020.03.10 දිනැති අංක 2166/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද (සංශෝධිත) ක්‍රීඩා නියෝගවල 8 (2) (ඉ) වගන්තිය පහත පරිදි නැවත සංශෝධනය වේ.

ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් වන සියලු අභියාචනා සළකා බැලීමෙන් අනතුරුව ජාතික ක්‍රීඩා සභාවේ අනුමැතිය ලත් විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු ඇතුළු ක්‍රීඩා විෂය හා ක්‍රීඩා නීතිය පිළිබඳ දැනුමැති හත් දෙනෙකුගෙන් (07) සමන්විත සංචිතයෙන් තෝරාගත් තිදෙනෙකුගෙන් සමන්විත අභියාචනා උපදේශක කමිටුවක් වෙත යොමු කළ යුතුය.

10 - 232

1A - G 032937 — 25 (2020/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*